**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2022**

-----------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු රු.1,309,280 ක පරිත්‍යාග ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී නිවැරදි කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පශ්චාත් උපාධි පාඨමාලා සම්පූර්ණ කිරීමට ලබා දී ඇති අවම කාල පරිච්ඡේදය තුළ පාඨමාලා ගාස්තු ආදායම් අදාල වර්ෂයේ ආදායමක් ලෙස හඳුනා ගැනීම හා උපරිම කාලසීමාව තුළ අය නොවූ ආදායම ලියාහැරීම ආයතනයේ ප්‍රතිපත්තිය වුවද, පාඨමාලාවන් 09 කට අදාළව එම කාලසීමාව තුළ නොලැබුණු රු.11,119,837 ක පාඨමාලා ගාස්තු ආදායම ලියා හැරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමට ලබා දී ඇති උපරිම කාල සීමාව ඉක්ම වූ ක්‍රියාකාරි සිසුන් 2023 වර්ෂය තුල නැවත සමාලෝචනය කර ඔවුන්ගෙන් ලැබිය යුතු පාඨමාලා ගාස්තු අයකර ගැනීමට හෝ ගිණුම් පොත්වලින් කපා හැරීමට කටයුතු කරනු ලබන බව. | ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේ ක්ෂය වෙන් කිරීම් වැඩිපුර සටහන් කිරීමේ වරද සමාලෝචිත වර්ෂය තුල නිවැරදි කිරීමේදී සමුච්චිත අරමුදලට හා සමුච්චිත ක්ෂය ගිණුමට දෝෂ සහිත ලෙස පිළිවෙලින් හර හා බැර කිරීම හේතුවෙන් සමුච්චිත අරමුදල් ශේෂය හා සමුච්චිත ක්ෂය | 2023 ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

ගිණුම රු.514,315 කින් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.

## 1.6 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 වන වගන්තිය | ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන පශ්චාත් උපාධි පාඨමාලා 54 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | 2019 දෙසැම්බර් මස 4 වන දින අනුමැතිය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කළද මේ දක්වාම ඒ සඳහා අනුමැතිය ලැබී නොමැති බව. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යය මණ්ඩලයේ ආචාරධර්ම හා අධ්‍යයන වගකීම් පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය - 2015 - මාර්ගෝපදේශ 25 | ආචාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයින් අතර ද්වි සම්බන්ධතාවයක් ඇති වීමේ තත්ත්වයන්අනාවරණය කර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ආයතනය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. | සියලුම ආචාර්යවරුන්ට පත්වීම් ලිපි ලබා දීමේදී ආචාර්යවරුන් හා ශිෂ්‍යයන් අතර ද්වි සම්බන්ධතාවයක් නොපැවැත්විය යුතු බවට වන කොන්දේසින් ඇතුලත් කර ඇති බව | මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කළ යුතුය |
| (ඇ) | 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | | | |
| | i. 4.5 ඡේදය | 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ ක්‍රියාත්මක කරන ලද පාඨමාලා 20 කට අදාලව අයවැයගත එකතු ආදායම රු.308,973,800 ක් සම්බන්ධයෙන් එම පාඨමාලා අවසානයේ දී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම්වල එක් එක් පාඨමාලාවන්ට අදාල මූල්‍ය ප්‍රකාශන එම පාඨමාලා අවසන් වන විට පිළියෙළ කිරිමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | ii . 2 හා 4.5 ඡේද | ශුන්‍ය පදනම(Zero Base) යටතේ ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම්වල පවත්වා ගෙන යා යුතු බවට දන්වා තිබියදීත්,2018 ජනවාරි 01 | පාඨමාලාවක් සඳහා ශිෂ්‍යයින් ලියාපදිංචි වන අවස්ථාවේදි ලැබෙන මුදල් හේතුවෙන් තාවකාලික මුදල් අතිරික්තයක් | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | දින සිට 2022 ඔක්තෝම්බර් 31 දින දක්වා කාලය තුළ ක්‍රියාත්මක කරන ලද ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් තුළින් ලද ආදායමින් රු.185,673,375 ක් අදාළ කාර්යයන් සඳහා යොදවා නොගෙන වාණිජ බැංකු 03 ක ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | ආයතනය තුළ පවතින බැවින් කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත්ව කෙටි කාලීන ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇති බව. | |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක PE/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6. ඡේදය | මුදල් වර්ෂය අවසන්වී මාස 05 ක් ඇතුළත ආයතනයේ විගණිත වාර්තාව සමඟ කාර්යසාධනය ඇතුළත් වාර්ෂික වාර්තාව භාෂා ත්‍රිත්වයෙන් පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත්, ආයතනය විසින් 2020 හා 2021 වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා මේ දක්වාම පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2020 වාර්ෂික වාර්තාව 2023 මාර්තු මස 29 වන දින පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට භාර දුන් අතර 2021 වාර්ෂික වාර්තාව අමාත්‍යාංශය දැනුම් දෙන දිනයකදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නියමිත බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.57,708,492 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.69,316,679 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.11,608,187ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සේවක පරිශ්‍රමිකය රු.11,730,630 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පශ්චාත් උපාධි පාඨමාලා සඳහා සියයට 75 කින්, දර්ශනවේදී පාඨමාලා සඳහා සියයට 95 කින් සහ දර්ශන ආචාර්ය උපාධි පාඨමාලා සඳහා සියයට 83 කින් සිසුන් බඳවා ගැනීම අඩු වී තිබූ අතර විදේශ ශිෂ්‍යයින් බඳවා ගැනීම ද සියයට 33 කින් අඩු වී තිබුණි. | කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් 2022 වර්ෂයට සිසුන් ඇතුලත් කිරීම 2023 ජනවාරි දක්වා කල් දැමීමට සිදු වුණු බව. | වාර්ෂික ක්‍රියාකාරී සැලසුම්වලට අනුව සිසුන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| University Network for Disaster Risk Reduction and Management in Indian Ocean ව්‍යාපෘතිය සැලැසුම් කළ පරිදි ආරම්භ නොකිරීම හේතුවෙන් ඒ වෙනුවෙන් ලැබී තිබුණු ප්‍රදානවලින් 2021 වර්ෂයේදී මිලදී ගත් රු.6,271,631 ක උපකරණ වසරකට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණි. | මෙම ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂයේදී ලැබී තිබුණු රු.6,271,361 ක් වටිනා උපකරණ 2023 වර්ෂයේ සිට භාවිතා කිරීමට කටයුතු කරන බව. | ව්‍යාපෘතිවල අපේක්ෂිත අරමුණු සඳහා අදාළ උපකරණ ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| National Languages Equality Advancement Project (NLEAP) ව්‍යාපෘතිය 2022 ජනවාරි 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ නිමකිරීම සඳහා රු.9,700,000 කට ගිවිසුම්ගතව තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට රු.5,446,039 ක් වැය කර තිබුණි. ගිවිසුම්ගත කාලය ඉක්මවා තිබුණු එම ව්‍යාපෘතිය තුලින් අපේක්ෂිත අරමුණු කිසිවක් ඉටුවී නොතිබුණි. | රට තුළ පැවති අස්ථාවර තත්වයන් හා ඉන්ධන අර්බුදය හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාද වුවද 2023 ජුනි 30 වන විට එම කටයුතු අවසන් කිරීමට නියමිත බව. | ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘතිවල කටයුතු නිම කළ යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 20 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළ රු. 9,087,356 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අවස්ථා කීපයකදීම කාර්යය මණ්ඩල තනතුරු අනුමත කරවා ගැනීම වෙනුවෙන් ඉල්ලීම් කර ඇතත්, මේ දක්වාම අනුමැතියක් නොලැබුණු බව. | කාර්යය මණ්ඩලය අනුමත සීමාව තුළ පවත්වා ගත යුතුය. |